Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

## සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2019 වර්ෂය

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සිසු හෙද පුහුණුව සඳහා බඳවාගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් කළ හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ්අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

| *සංකේත අංකය* | *සේවාව* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාලසීමාව* | *පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|---|---|
| 01 | හෙද | හෙද නිළධාරි | වසර 03 | ඉංග්‍රීසි |

අංක 01 වගුව

02. *අධ්‍යාපන හා තනතුරට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් :-*

| *අ.පො.ස (සා. පෙළ) සුදුසුකම්* | *අ.පො.ස (උ. පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම්* |
|---|---|---|
| සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | 2017 හෝ 2018 යන වර්ෂවලින් එකක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03කින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර);<br><br>හෝ<br><br>2017 හෝ 2018 යන වර්ෂවලින් එකක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03කින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) | 2020.03.31 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 28ට නොවැඩි විය යුතු ය.<br><br>උස අඩි 04 යි, අඟල් 10 කට (147.3 CM) නොඅඩු විය යුතු ය.<br><br>අවිවාහක විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |

3. සිසු හෙද පුහුණුවට අදාළ කරුණු :

3.1 සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීම අංක 1837/8 හා 2013.11.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාවට හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් සිදුකරනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම් කරගනිමින් සිදුකරනු ලැබේ.)

3.2 දිවයිනෙන් සිසු හෙද පුහුණුවට බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.3 ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව අදාල දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම්කර අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති හෙද සේවයට අයදුම්කර තිබෙන මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.4 ඉන්පසු එම එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම වර්ෂයේ ජීව විද්‍යා විෂය ධාරාව හා භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ හෙද සේවයට අයදුම්කර අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවට සාමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂවලට අදාළ එක් එක් විෂය ධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.5 එලෙස එක් එක් වර්ෂයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% ක් පිරිමි අයදුම්කරුවන්ගෙන් ද, 95%ක් ගැහැණු අයදුම්කරුවන්ගෙන් ද සමන්විත වන ලෙස එක් එක් වර්ෂයන්හි එක් එක් විෂය ධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් පුහුණුවට බඳවා ගනු ලැබේ.

4. *පොදු කරුණු :*

4.1 ශ්‍රී ලංකික පුරවැසියෙකු විය යුතු ය.;

4.2 සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශයක සේවය ලබාදීම සඳහා අන් සෑම අයුරකින් ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

4.3 තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4.4 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

4.5 මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

4.6 පුහුණුවෙන් පසු මධ්‍යම රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් ලද හොත් ඔබ අවම වශයෙන් වසර 10ක් වත් සේවය කිරීමට එකඟ විය යුතු ය.

4.7 තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාරග න්නා අවසන් දිනය වන 2020.03.31 වැනි දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය. එය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

*සටහන :-*
යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ විවාහ වීම මත හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අපේක්ෂකයකුට පූර්වාසන්න වසර 03 තුළ පදිංචිය සනාථ කළ නොහැකි අවස්ථාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කළහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලැබේ.

4.8 යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව දිවයිනේ සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදාහරිනු ලැබේ.

5. *වෙනත් කරුණු :*

5.1 මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් වේ. එබැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතු ය. යමෙකු එසේ අයදුම් කර, පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අය කර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය. (5.2)

5.2 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි ව සිටියේනම් හෝ සිටින්නේ නම්, මෙම පාඨමාලාවට ලියාපදිංචි කරනු ලබන දිනය වන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතු ය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුව ද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින්, එවැනි අයදුම්කරවන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය. අවශ්‍ය අවස්ථාවලදී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතු ය.

5.3 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතු ය.

5.4 2020.03.31 වැනි දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද, යම් හෙයකින් ඉහත පුහුණු පාඨමාලාව සඳහා ලියාපදිංචි කරන දින වන විට ලියාපදිංචි වී සිටියේ නම් ඔහු/ඇය ද උක්ත පුහුණු පාඨමාලාව සඳහා ලියාපදිංචිය ලබා ගැනීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කර ගත යුතු ය.

5.5 සෞඛ්‍ය, සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි

වී සිටින අයදුම්කරුවන් මෙම පුහුණුවට තේරී පත්වුව හොත් ඒ වනවිට ලබමින් සිටි පුහුණුවට අදාළව එළඹ ඇති ගිවිසුම්වලට අනුව ගිවිසුම්ගත මුදල හා ඒ වන විට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් ඉහත පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

5.6 ඉහත කොන්දෙසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන් ම ඔබ අයදුම් කරන මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට් නිවේදනයේ* කුමන හෝ වගන්තියක් මගින් අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහි තබා ගත යුතු ය. එමෙන් ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

5.7 අධ්‍යාපන සුදුසකම් හා අනෙකුත් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2020.03.31 වැනි දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

6. *අයදුම්කළ යුතු ක්‍රමය* :

6.1 ඉහත පුහුණු පාඨමාලාව සඳහා අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ්අඩවියේ අදාළ කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කර එවිය යුතු ය. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් එකී විද්‍යුත් අයදුම්පතෙහි ද දක්වා ඇත.

6.2 අයදුම්කරුවන්/අයදුම්කාරියන් රු.500.00ක මුදලක් ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, විභාග ගාස්තු රැස්කිරීම ගිණුමට ගෙවිය යුතු ය. ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීම් කළ හැකි ය. මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

6.3 මෙලෙස ඔබ විසින් සාර්ථකව උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි පිටපත් තැපැල් මගින් මෙම අමාත්‍යාංශය වෙත එවීමට අවශ්‍ය නොවේ. එහෙත්, අයදුම්පත උඩගත කිරීමෙන් අනතුරුව ලැබෙන අංක 5 කින් යුත් කේතය, මුද්‍රිත පිටපත් පසුව ලබා ගැනීමේ පහසුව සඳහා සුරක්ෂිතව තබාග න්න. එසේම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (PRINT OUT) ලබාගෙන එහි අදාළ ස්ථානයේ ඔබගේ අත්සන යොදා අත්සන සහතික කරවාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවුවහොත් රැගෙන ආයුතුය. (7 වැනි කොටස බලන්න.)

*සටහන* :-අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී ඔබට යම් ගැටළුවක් ඇති වුව හොත් ඒ සම්බන්ධයෙන් සතියේ වැඩකරන දින පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 අතර කාලය තුළ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකථන අංක 0112 693 955 ඇමතීමෙන් මේ සම්බන්ධයෙන් උපදෙස් ලබාගත හැකි ය.

7. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :-

7.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විශ්වයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 512,148.00කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතු ය.

7.2 රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය. එමෙන්ම, මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබා ගත යුතු ය.

7.3 මෙම නිවේදනයේ දක්වෙන නියමයන්ට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සම්මුඛ පරීක්ෂණයකට ඔබ කැඳවුම් ලැබුවහොත් ඔබ විසින් ඉදිරිපත් කළ යුතු තොරතුරු :-

8.1 ඔබ විසින් සාර්ථකව උඩගතකර (UPLOAD) ඇති විද්‍යුත් අයදුම්පත අනුව අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හෙද සේවා ව්‍යවස්ථාවේ හා මෙම *ගැසට්* නිවේදනයේ හෙද නිලධාරි තනතුරු වෙනුවෙන් දක්වා ඇති සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලිපිලේඛනයන්හි *මුල් පිටපත්* ඉදිරිපත් කළ යුතු ය.

8.2 විද්‍යුත් මාධ්‍යයෙන් උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත (ඔබගේ අත්සන සහතික කරන ලද).

8.3 උප්පැන්න සහතිකය.

8.4 අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල සහතිකය හා Z අගය දක්වෙන ලේඛනය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

8.5 අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

8.6 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.

8.7 බැංකුවට මුල් ගෙවූ ලදුපත.

8.8 ඉහත දක්වෙන පරිදි පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය.

8.9 අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ රු. 50.00ක මුද්දරයක් මත අත්සන් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශයක්.

8.10 විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ /සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ පාඨමාලාවක ලියාපදිංචි වී හෝ සහභාගි නොවන බවට ඔබගේ බහුමාන සහතිකය.

*සටහන :*

(අ) තවද, ඉහතින් සඳහන් (8.3) සිට (8.7) දක්වා ලේඛනයන්හි මුල් පිටපත්වලට අමතරව සත්‍ය බවට තමා විසින්ම සහතික කරන ලද ඡායා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී රැගෙන ආ යුතු ය.

(ආ) පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, සෞඛ්‍ය, සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර එසේ තේරුම් ගත යුතු ද නොවේ.

(ඈ) සම්මුඛ පරීක්ෂයෙන් පසු තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් පිළිබඳ තොරතුරු http:// www.health.gov.lk වෙබ්අඩවියේ පළකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

9. *පුහුණු කිරීමේ පරිපාටිය :*

9.1 සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් /අයදුම්කාරියන් අතුරින් තෝරා ගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් හෙද පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුලත් කරනු ලැබේ. පාඨමාලා කාලය සහ හැදෑරිය යුතු මාධ්‍යය අංක I වගුවේ දක්වා ඇත.

9.2 තෝරාගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

9.3 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවාගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට හෙළි වුවහොත් හෝ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

9.4 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V හි විධිවිධාන වලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

9.5 පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම ලදහොත් අවම වශයෙන් වසර දහයක (10) කාල පරිච්ඡේදයක් රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවය යටතේ හෙද නිලධාරි තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. ඉහත (9.3) කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැර ගියහොත්, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදු වුවහොත් හෝ පත්වීම ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් ඉහත පරිදි අදාළ, තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළ දී ඔහුට/ ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියදම් හා ගිවිසුම්ගත මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය, සේවා සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අය කර ගැනීමට ගිවිසුම් ප්‍රකාර නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

9.6 මෙම පාඨමාලාව සඳහා අයදුම්කරන අයදුම්කරුවන්/අයදුම්කාරියන් අයදුම්පත් යොමු කරන දිනය වන විට අවිවාහක විය යුතු අතර, පුහුණුව ලබන කාලය තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්යය වේ.

10. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :*

10.1 පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී, එහෙත් පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා වූ පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරින් වෙත ස්ථාන මාරු ලබා

දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පුහුණුව සාර්ථකව නිමකර අවසන් පරීක්ෂණය සමත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැළකිල්ලට ගෙන අදාළ තනතුරේ III වන පංතියේ තනතුරකට පත් කිරීම සඳහා සළකා බලනු ලැබේ. එමෙන්ම තෝරා ගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත්කිරීමට යටත් වේ.

10.2 පුහුණු කාලය අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කළහොත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

10.3 අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැළකිළිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරෙන් පහකරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද, පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව රජය විසින් දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාළ මුදල ද ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

10.4 තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් මෙම පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අසමත් වන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

10.5 ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ චක්‍ර ලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

10.6 පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අය කරනු ලැබේ.

10.7 මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීමට කිසිම අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කළ බව අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරනු ඇත.

10.8 පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදාවුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය, සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

හඳානී ජයවර්ධන,
ලේකම්,
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2020 පෙබරවාරි මස 18 වැනි දින,
"සුවසිරිපාය"
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.